# බස්නාහිර පළාත් සභාව

## බස්නාහිර පළාත  තුළ ස්ථාපිත ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යවසායන් පුළුල් කිරිම සඳහා ක්‍රියාත්මක සහන ණය යෝජනා ක්‍රමය - 2026

### අයදුම්පත් කැඳවීම

බස්නාහිර පළාත තුළ ස්ථාපිතව ඇති ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යවසායන් පුළුල් කිරීමේ අරමුණින් පළාතේ ස්ථිර පදිංචිය ඇති, වයස අවුරුදු 18ට වැඩි ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**ණය යෝජනා ක්‍රමය පිළිබඳ විස්තර :**

| | |
|---|---|
| එක් ව්‍යවසායක් සඳහා ලබා දෙන උපරිම ණය මුදල | රුපියල් මිලියන 3.0 |
| වාර්ෂික ණය පොලී අනුපාතය | 3% |
| ණය ආපසු ගෙවීමේ උපරිම කාලසීමාව | මාස 84 (මාස 6ක සහන කාලයක් ද ඇතුළත්ව) |
| ණය පහසුකම් සලසන ආකාරය | මහජන බැංකුව මගින් |
| ණය ලබා දෙන කාර්යයන් | - යන්ත්‍රසූත්‍ර හා උපකරණ මිලදී ගැනීම<br>- ප්‍රමිති සහතික ලබා ගැනීම<br>- ව්‍යවසාය සඳහා අවශ්‍ය වන විශේෂිත ගොඩනැඟිලි ඉදිකිරීම්/වැඩිදියුණු කිරීම් |

**ප්‍රමුඛතාව ලබා දෙන ව්‍යවසාය ක්ෂේත්‍ර**

- කෘෂි ආශ්‍රිත නිෂ්පාදන හෝ අගය එකතු කළ නිෂ්පාදන
- සත්ත්ව නිෂ්පාදන හෝ අගය එකතු කළ නිෂ්පාදන
- විසිතුරු මත්ස්‍ය වගාව හා ඒ ආශ්‍රිත ව්‍යවසාය
- සුළු පරිමාණ ඇඟලුම් ආශ්‍රිත නිෂ්පාදන
- සුළු පරිමාණ සම් හා සම් ආශ්‍රිත නිෂ්පාදන
- සාම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන
- දේශීය කුළුබඩු ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන
- විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය
- සබන් හා සේදුම් කාරක නිෂ්පාදන
- සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන
- ආයුර්වේද ආශ්‍රිත නිෂ්පාදන
- ලුහු කර්මාන්ත
- දේශීය අමුද්‍රව්‍ය භාවිත කර ආහාර නිෂ්පාදනය
- නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය ආශ්‍රිත ව්‍යවසාය
- වාහන අලුත්වැඩියාව ආශ්‍රිත ව්‍යවසාය
- දේශීය අමුද්‍රව්‍ය උපයෝගී කරගනිමින් අපනයනය ඉලක්ක කරන නිෂ්පාදන
- දේශීය හා විදේශීය සංචාරකයින් ඉලක්ක කරගත් නිෂ්පාදන ව්‍යවසාය
- ණය කළමනාකරණ කමිටුව විසින් පිළිගන්නා වෙනත් නිෂ්පාදන ව්‍යවසාය

*තොග, සිල්ලර හෝ අතරමැදි ව්‍යාපාර මෙම ණය යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් නොලබයි.

**ණය අයදුම් කිරීම සඳහා මූලික සුදුසුකම්**

I. ව්‍යවසායකයා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

II. වයස අවුරුදු 18 ට වැඩි විය යුතුය.

III. ව්‍යවසාය පහත ආයතන අතුරින් එකක ලියාපදිංචි කර අවම වශයෙන් වසරක්වත් ගත වී තිබිය යුතුයි.

   a) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
   b) බස්නාහිර පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
   c) බස්නාහිර පළාත් සභාවට අයත් දෙපාර්තමේන්තුවක් හෝ අධිකාරියක්
   d) ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
   e) ව්‍යවසායට අදාළව අවසර ලබාගත යුතු වෙනත් රාජ්‍ය ආයතනයක් හෝ අර්ධ රාජ්‍ය ආයතනයක්

IV. තමා විසින් තනිව සිදුකරන ව්‍යවසායක් (ස්වයං රැකියාවක්) හෝ සේවකයන් 50 ට අඩු පිරිසක් සේවයේ යොදවන ව්‍යවසායක් විය යුතුයි.

V. සේවකයන් සේවයේ යොදවන්නේ නම්, ව්‍යවසාය සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි කර තිබිය යුතුයි.

**ණය ලබා දීමේ ක්‍රමවේදය**

- සම්පූර්ණ කරන ලද අයදුම්පත තමා ස්ථිර පදිංචි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී මගින් පදිංචිය සනාථ කර 2026.07.31 දිනට පෙර ව්‍යවසාය ස්ථාපිත බල ප්‍රදේශයේ, ප්‍රාදේශීය ලේකම් වෙත භාර දිය යුතුය. එදිනට පසු ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

  **සැ.යු.** - ස්ථිර පදිංචිය, ව්‍යවසාය ස්ථාපිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නොවන්නේ නම්, තමා පදිංචි වසමේ ග්‍රාම නිලධාරීගෙන් හා අදාළ ප්‍රාදේශීය ලේකම්ගෙන් පදිංචිය සනාථ කර තිබිය යුතුය.

- සුදුසුකම් සහිත අයදුම්පත්, ව්‍යවසාය ස්ථාපිත කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කර බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් වෙත එවනු ඇත.

- ලැබෙන සියලුම අයදුම්පත් බස්නාහිර පළාත් සභාවේ ණය කළමනාකරණ කමිටුව මගින් ඇගයීම් කර පළාත් සභාවේ නිර්ණායකයන්ට අනුකූල වන අයදුම්පත්, පවතින ප්‍රතිපාදන සීමාවන් ද සලකා, ඉදිරි කටයුතු සඳහා මහජන බැංකුවේ ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරනු ලැබේ.

  **සැ.යු.** - ණය අයදුම්පත් සම්බන්ධයෙන් ණය කළමනාකරණ කමිටුව ගන්නා තීරණ අවසන් තීරණය වේ.

- බැංකුව වෙත යොමු කරන ලද අයදුම්පත් බැංකුවේ නිර්ණායකයන්ට අදාළව ඇගයීම් කර සුදුසු අයදුම්කරුවන් සඳහා ණය නිකුත් කරනු ඇත. බැංකුවේ නිර්ණායකයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය. (අයදුම්කරුගේ පෙර ණය ගෙවීම් පිළිබඳ තොරතුරු, ණය තොරතුරු කාර්යාංශය මගින් (CRIB) තහවුරු කරගනු ඇත.)

  ණය අයදුම්පත හා ඊට අදාළ උපදෙස් පත්‍රිකාව බස්නාහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලයේ වෙබ් අඩවිය මගින් (https://pla.chiefsec.wp.gov.lk) බාගත කර ගත හැකිය.

වැඩි විස්තර **0112092532** දුරකථන අංකය ඇමතීමෙන් ලබා ගත හැක.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර**
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත
2026.07.16